# සැඳෑ කළුවර









පසුගියද මව්බිමේ දී නොහුරු අත්දැකීමක් ලබාගන්නට අප හට අවස්ථාව ලැබුණා. දිවයිනේ විශිෂ්ටතම ගායන ශිල්පිනියක වන විශාරද නන්ද මාලනියගේ සංගීත ආශ්‍රමයේ සිසු සිසුවියන් හතළිස් දෙදෙනෙකු සිය දෙමව්පියන් ඉදිරියේ ශිල්ප දැක්වීමත් නාවල වික්‍රමසිංහාරාම විහාරස්ථානයේ ශාලිකාවක කළාය. ඊට සහභාගී වීමට ලැබීම සැබැවින්ම විදෙස් ගතව සිටිනා අප හට "කණ කැස්බෑවෙකු විය සිදුරින් සඳ දැකීමක් " ම වුණා. එහිදී දෙමව්පියන් පිළිගනිමින් හා සිසු දරු-වන්ගේ ගායනා අතරේ දෙමව්පියන් දැනුවත් කරමින් ද විශාරද නන්ද මාලනිය දැක් වූ කරුණු ඉතා වැදගත් වුණා.

"මේ දරුවන් මේ වෙනකොට ඉහළම දක්ෂතා පෙන්වන අය. තමන් මව් කුසයේ ඉන්න කාලයේ පටන් ම මේ අය මේ සංගීත විෂයය ගැන සංවේදී වෙනවා. ඒ කියන්නේ උපතින්ම ගෙනාව හැකියාව මේ දරුවන්ගේ දෙමව්පියන්ට අපි මුලින්ම ස්තූතිවන්ත වෙන්නේ මේ වාගේ හැකියාව-න් තියෙන දරුවන් මේ ලෝකෙට දායාද කළ නිසයි. දෙවනුව ස්තූතිවන්ත වෙන්න ඕනේ ඒ දරුවන්ගේ හැකියාවන් හඳුනාගෙන නිසි හැදෑරීමක් කරන්න ඒ අයට යොමු කරවන එකට ..."

"මල පිදෙන්න දෙන්න ඕන. අපි බලෙන් පුදන්න ගියොත් මල ඉක්මනට පරවෙනවා. මේ ඉන්න දරුවන් කාටවත් පිදෙන්න හදිස්සියක් නෑ. මාධ්‍යවල පෙනී හිටින්න හදිස්සියක් නෑ. ඒව එන්න තියෙනවානම් එනවා. දැන් මගේ පවුගේ අය ගත්තොත් මට විතරයි මේ ගායන හැකියාව උපතින්ම ලැබුණේ. ඒත් අපේ දෙමව්පියන්ට ඕන වුණේ නෑ හදිස්සි ගමනක් යවන්න..."

"සංගීත විෂය හදරද්දී ඒක භාවනාවක් වාගේ. මනස සන්සුන් වෙලා නිරවුල් වෙන්න ඕන. ගායනයක් ඉදිරිපත් කරන්න සූදානම් වෙනකොට සිත් තැවුල්, අවේග වාගේ දේවල් හිතට ගන්න හොඳ නෑ. එහෙම වුණොත් ගායනයෙදි උගුර හිර වෙනවා. ඒ නිසා මම මේ ආදරණීය දෙමව්පියන්ගෙන් ඉල්ලා සිටින්නේ දරු-වන්ගේ හිත් තලන්න එපාය කියලයි."

විශාරද නන්ද මාලිනිය සිය සංගීත පාඨමාලාව පිළිබඳවත් කරුණු පැහැදිලි කළා.

"අපි මේ දරුවන්ව ඉන්දියානු සංගීත විභාගයකට සූදානම් කරලය තියෙන්නේ. මේ විභාගය "ප්‍රථමා" කියන විභාගයයි. මේ විදියට අවුරුදු පහක් විතර ඉගෙනගත්තම 'ඩිප්ලෝමා' කියන විභාගය කරන්න පුළුවන්. ඒ විභාගය සමත් වුණ අයට ගුරු පත්වීමක් ලබන්න සුදුසුකම ලැබෙනවා. කැමති අයට තව තව ඉහළට ඉගෙනගන්න පුළුවන්. අපි එහෙම අය ඒ විභාගවලට සූදානම් කරවන ආයතන වලට යොමු කරවනවා."

අපි ඉතින් මේ දරුවන්ගේ සටහන් පොත් පවා බලනවා. ඒවා හරියට නැතිනම් විෂය හරියට ඉගෙන ගන්න අමාරුයි. දැන් අපි "උච්ච - ස" ස්වරය පොතේ ලියනකොට " ස" අකුරට උඩින් තිතක් තියනවා. ඒ තිත නොතිබ්බොත් ඒක "මධ්‍ය -ස" වෙනවා. සම්පූර්ණයෙන්ම වෙනස් ස්වරයක් ඒක. ඉතින් මේ තිත හරියට සටහන් නොවුණොත් වෙනස්ම ස්වරයක් තමයි ගායනා කරන්න වෙන්නේ. ඔය එක උදාහරණයක් විතරයි. ඒ නිසා සටහන් පොත් නිවැරදිව තියාගන්න එක සංගීත විෂය හදරනකොට හරි වැදගත් වෙනවා."

සෞන්දර්ය විෂයන් වල මූලිකව ධාරා තුනක් තියෙනවා. ඒ චිත්‍ර, නැටුම්, සංගීතය කියන ධාරාවන්. ඉන් වැඩියෙන්ම සැළකුම් ලබන්නේ සංගීතවේදීන්. මේ හැම දේටම මූලිකව නිවැරදි සෘතියට ගැයීමේ හැකියාව තියෙන්න ඕන. හරියට සෘතියට ගායනා කරනකොට කියන්නේ බඹරා වගේ ගායනා කරනවා කියලා. ඒ වාගේම හුස්ම පාලනයත් වැදගත්. මේ දේවල්වලට මානසික ඒකාග්‍රතාවය අවශ්‍යයි. ඒ වෙනුවෙන් කැපවීමත් අවශ්‍යම දෙයක්. "

"පිරිමි දරුවන් තරුණ බවට පත්වෙන කොට කට හඬ වෙනස් වෙනවා. ඉතින් අපි ඒක හදන්න ඕන. සමහර විට ඒ අයට වෙනම ම සෘතියකට ය ගයන්න වෙන්නේ."

ඉතින් අපි මේ හැම දෙයක් ම කරන්-න් විනෝදයෙන් සැහැල්ලුවෙන්. දරු-වන්ට ඒක අවශ්‍යයි. අවශ්‍ය දේට සැර වෙනවා තමයි. ඒත් දරුවෝ දන්නවා ඒ තරහට නෙවෙයි කියලා. අපි උගන්වන සමහර දේවල් අමුයි, කර්කෂයි. ඉතින් ඒ ගතිය අඩු කරන්න සතුටින් සැහැල්ලුවෙන් දරුවන්ට සමීපව ඉගැන්වීම් කරනවා. ඉතින් දරුවොත් මට සමීපයි. පාඩම් ඉවරවෙලා ගෙදරයන්න කලින් මේ අය හැමෝම මට වඳිනවා. දරුවෝ කොයිතරම් සමීප ද කියනවා නම් දෙන්නෙක් ඉන්නවා හැමදම මට වඳින් ගමන් කකුල කොනිත්තනවා. මාත් ඉතින් කොනිත්තන්න ඇරලා ඉන්නවා."

ශබ්ද විකාශන යන්ත්‍රවල පිහිටක් නැතිව විශාරද නන්ද මාලනිය කළ කතා මෙන්ම ගායනා ද ඇයගේ නිර්ව්‍යාජ සිංහල කට හඬින් නිරවුල්ව ඉදිරිපත් වුණා. ඒ හඬ මුළු ශාලාව පුරාම පැතිරුණේ අපට හුරු පුරුදු ඇයගේ හඬින්.

දරුවන් අපෙන් යමක් ලබා ගන්නවා වගේම අපිත් දරුවන්ගෙන් ජීවය ලබනවා. දරුවන් එක්ක ඉන්න වෙලාවට කෑ ගහලම තමයි මේ කටහඬ මේ විදියට තවම රැඳිලා තියෙන්නේ. කුඩා දරුවන්ගේ නඩු හබ වලට වගේම තරුණ දරුවන්ගේ ආල කතන්දර වලටත් අපිට කන් දෙන්න වෙනවා. අවවාද වගේම උදව් දෙන්නත් වෙනවා. මේ දේවල් අතරේ අපේ ජිවිතය නිරෝගීව ගතවෙනවා. ප්‍රයෝජනවත්ව ගත වෙනවා. කාටද කියන්න පුළුවන් මට දැන් වයස හැත්තෑවක් කියලා ?" ඇය සිනාසුනා. සංගීත ගායනාවන් අතරේ ඒ පිළිබඳව විස්තර කිරීමට උනන්දු වුණා වගේම ඉංග්‍රීසි භාෂාව ඉගෙනගැනීම වගේ දේ පිළිබඳවත් ඇය දෙමව්පියන්ගේ අවධානයට ලක්කළා.

*සැඳෑ කළුවර කුර ග ගා විත්*
*ඔබේ පැල්පත මගේ දසුනින්*
*ඈත් වූ සඳ මගේ සරා සඳ*
*තනි වෙලා මා තනිවෙලා ..........*

*වළාකුලකුදු නොමැති අහසේ*
*මලානික වූ මගේ සිහිනේ*
*ගල් ගැසී ඇත පාළු වී ඇත*
*අඳුර පමණක් රජ වෙලා .......*

*ඔබේ ලෝකය - මගේ ලෝකය*
*අතර ඇත්තේ රැයක් පමණයි*
*ගව් ගණන් දුර ජීවිතේ බර*
*මගේ හිස මත බර වෙලා ...*

*රචනය : මඩවල එස්. රත්නායක*
*තනුව, සංගීතය හා ගායනය :*
*විශාරද නන්ද මාලිනී*

"අපි මේ දරුවන්ව ඉදිරිපත් කරවන්නේ ඉන්දියානු විභාග වලට. ඉතින් විභාග පරීක්ෂකවරු එන්නේ ඉන්දියාවෙන්. කතා කරන්නේ ඉංග්‍රීසියෙන්. ඉතින් ඒ අහන දේවල් වටහාගන්න උත්තර දෙන්න ඉංග්‍රීසි භාෂාවත් අවශ්‍ය ම වෙනවා...."

භෛරව රාගයට අනුකූලව නිර්මාණය වුණා "කහවන් ගොයමට " ගීතය, "වෙසක් කැකුළු", "වළා කුලින් බැස" වාගේ ගීත දරුවන් ගායනා කළේ යමන්, ආශාවරී වගේ රාග ගායනා කරන අතරේදියි.

මේ හැම දෙයක්ම කට පාඩමිනුයි ගායනා කළේ. රාග වල අලංකාර කොටස්, තාන්ස් පවා එක හඬින් එක ස්වරයෙන් දරුවන් ගායනා කරපු ආකාරය හරිම අගෙයි. රබන් ගී ගැයීමට පෙර ජන ගී ගැනත් විශාරද නන්ද මාලනිය හැඳින්වීමක් කළා. ජන ගී අතරේ එන " අස්නේ" ගායනාවට අනුව ඇය තනුව නිර්මාණය කර ගැයූ "සැඳෑ කළුවර" ගීතය කිසිම වාද්‍ය භාණ්ඩයක් වයන්නේ නැතිව, ශබ්ද වාහිනී යන්ත්‍ර නැතිව ශාලාවටම ඇසෙන්නට ගැයූ හැටි දැනටත් කන්වල නිමිනා ද වෙනවා. උත්සවය අවසානයේ අප ඇයට ආචාර කර ස්තූතිවන්ත වුයේ "ගී සඳළුව" මේ ගැන ලියන්නට ඇය දුන් අවසරය වෙනුවෙන්. ඇයට නිරෝගී සුව හා දීර්ඝායු පැතීම අපගේත් යුතුකමක්. ඉතින් අපිත් අනෙක් දෙමව්පියන් සමගින් සැඳෑ කළුවරට එක්වුණා.





වයස අවුරුදු 8-12 අතර ගැහැනු සහ පිරිමි දරුවන් සඳහා විශේෂ ක්‍රිකට් පුහුණු වැඩ සටහන් මාලාවක් ක්‍රිකට් ඔස්ට්‍රලියා සූදානම් කර ඇති අතර මෙය ඔබේ දුවට , පුතාට ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව මූලික දැනුම හරවත්ව සහ විනොදත්මක්ව ලබාගැනීමට වඩාත් සුදුසු අවස්ථාවකි ඒ පිළිබඳව වැඩි විස්තර පහත ඇති වෙබ් අඩවි වලින් ලබාගන්න

www.playcricket.com.au or www.t20blast.com.au

Budding cricketers in Melbourne's South East will have the opportunity to join Cricket Australia's newest pathway to cricket, T20 Blast, with a **10 week program** starting in November.

Held at Sweeney Reserve, Narre Warren, Casey T20 Blast is an action filled format designed for **boys and girls aged 8-12** and introduce junior cricketers to competitive competition.

The Casey T20 Blast program is aligned with the Big Bash team; Melbourne Stars and last year's participants were surprised with a visit from Aussie spearhead, Peter Siddle.

The Stars again will benefit from the return of Sri Lankan Ace, Lasith Malinga who holds the competition best bowling figures (6/7 vs Perth Scorchers).

Casey T20 Blast sessions run for 90 minutes on Friday nights, and allow kids and parents alike to be involved in a fun and safe environment, with soft balls used and no protective equipment necessary, whilst all gear is provided.

Harmony In Cricket Ambassadors, Kevin Tissera and Harry Fernando will run the sessions and the program will provide the opportunity for kids irrespective of race or religion or gender to play.

The Big Bash has been a fantastic showcase of the growing diversity in Australian cricket, with players such as Usman Khawaja, Fawad Ahmed, Gurinder Sandhu, Ashton Agar and Narre Warren's own Clive Rose all having a link to the subcontinent.

"issera hopes that programs such as this encourage more children to take up the game.

"The aim of programs such as these is obviously to get more kids playing the game. It would be fantastic if some of these kids were to reach higher honours, however our aim will be to introduce this great game to the kids and more importantly ensure they have fun," Tissera said.

Written By: Harry Fernando

The total cost of the program is $99 and covers ten weeks of cricket starting in November. Each registered participant will also receive:

~ ***Melbourne Stars Junior Membership***
~ ***Melbourne Stars Membership Pack***
~ ***Melbourne Stars T-shirt***
~ ***Melbourne Stars Cap***

Additionally there will be a chance to meet the Melbourne Stars players with a session at their Family Day in December.

Before the program officially starts in November, there will be 2 weeks of **FREE 'Come and Try' sessions** starting on October 26th at Sweeney Reserve, Narre Warren.

To register simply log on to **www.playcricket.com.au** or **www.t20blast.com.au** and type in Casey T20 Blast.